4

# මිල සහ වැටුප්

තිල පාරිභෝගික මිල දර්ශක මගින් මනිනු ලබන පොදු මිල මට්ටම, 2021 වසරේ ජනවාරි සිට සැප්තැම්බර් දක්වා වූ මාස නවයක කාලපරිච්ඡේදය තුළ දී සමස්තයක් ලෙස ඉහළ යෑමේ ප්‍රවණතාවක් පෙන්නුම් කළේය. විශේෂයෙන්ම, ජාත්‍යන්තර වෙළඳපොළේ භාණ්ඩ මිල ගණන් ඉහළ යෑම සහ අභ්‍යන්තර සැපයුම් ජාල තුළ ඇති වූ අවහිරතා දේශීය වෙළඳපොළෙහි ආහාර මිල ගණන් ඉහළ යෑම කෙරෙහි සැලකිය යුතු බලපෑමක් ඇති කරන ලදී. ආහාර කාණ්ඩය සැලකූ විට මෙම වසර තුළ දී වැඩි වශයෙන් ඉහළ යෑම් පෙන්නුම් කළ නිතර මිල උච්චාවචනය වන ආහාර කාණ්ඩය පොදු මිල මට්ටමේ ඉහළ යෑම සඳහා වැඩිම දායකත්වය දක්වන ලදී. ආහාර නොවන කාණ්ඩයේ අයිතමවල මිල ගණන් සලකා බලනු ලැබූ කාලපරිච්ඡේදයේ දී ඉහළ ගිය ද, ඒ තුළින් පොදු මිල මට්ටමට ඇතිකරන ලද බලපෑම ආහාර කාණ්ඩය තුළින් ඇති කළ බලපෑමට වඩා අඩු මට්ටමක පැවතුණි. මෙම ප්‍රවණතා පිළිබිඹු කරමින්, 2021 ජනවාරි මාසයේ දර්ශකාංක 138.7ක් වාර්තා කළ කො.පා.මි.ද., සැප්තැම්බර් මාසයේ දී දර්ශකාංක 144.1ක් වාර්තා කරමින් සමස්තයක් ලෙස ඉහළ යෑමේ නැඹුරුතාවක් පෙන්නුම් කරන ලදී. එමෙන්ම, ජා.පා.මි. දර්ශකය ද 2021 ජනවාරි මාසයේ දී පෙන්නුම් කළ දර්ශකාංක 142.1හි සිට 2021 සැප්තැම්බර් මාසයේ දී පෙන්නුම් කළ දර්ශකාංක 147.5 දක්වා අඛණ්ඩව ඉහළ යන ලදී. ඒ අනුව, 2021 වසරේ මේ දක්වා කාලය තුළ දී, කො.පා.මි.ද. සහ ජා.පා.මි.ද. වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස මගින් මනිනු ලබන මතුපිට උද්ධමනය ඉහළ යෑමේ ප්‍රවණතාවක් පෙන්නුම් කළ අතර, විශේෂයෙන්ම එම කාලපරිච්ඡේදයේ අවසාන කාල පරාසයේ දී මතුපිට උද්ධමන අගයන් ඉතා ඉහළ අගයන්හි පැවතුණි. මේ අතර, අවිධිමත් පෞද්ගලික අංශයේ නාමික හා මූර්ත වැටුප් ප්‍රමාණ දර්ශක 2020 වසරේ ජනවාරි සිට අගෝස්තු දක්වා වූ මාස අටක කාලපරිච්ඡේදය හා සැසඳීමේ දී, 2021 වසරේ අනුරූප කාලපරිච්ඡේදය තුළ දී ඉහළ යෑමක් පෙන්නුම් කරන ලදී. එමෙන්ම, පඩිපාලක සභා මගින් වැටුප් පාලනය වන විධිමත් පෞද්ගලික අංශයේ සේවකයන්ගේ නාමික සහ මූර්ත වැටුප් ප්‍රමාණ දර්ශක සැලකිය යුතු ලෙස ඉහළ ගිය අතර, මේ සඳහා වතු අංශයේ සේවකයන්ගේ අවම වැටුප් ඉහළ නැංවීම හේතු විය. 2020 වසරේ ජනවාරි සිට අගෝස්තු දක්වා වූ මාස අටක කාලපරිච්ඡේදය සමඟ සැසඳීමේ දී, 2021 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේ දී, රාජ්‍ය අංශයේ නාමික වැටුප් ප්‍රමාණ දර්ශකය වෙනසක් පෙන්නුම් නොකළ අතර, මූර්ත වැටුප් ප්‍රමාණ දර්ශකයේ අඩුවීමක් දක්නට ලැබුණි.

## 4.1 මිල

### පොදු මිල මට්ටමේ විචලන

නිල පාරිභෝගික මිල දර්ශක වන කො.පා.මි.ද. සහ ජා.පා.මි.ද.[1] මගින් මනිනු ලබන පොදු මිල මට්ටම 2021 වසරේ ජනවාරි සිට සැප්තැම්බර් දක්වා කාලපරිච්ඡේදය තුළ සමස්තයක් ලෙස ඉහළ යන නැඹුරුවක් පෙන්නුම් කළේය. ආහාර සහ ආහාර නොවන කාණ්ඩ දෙකෙහිම මිල මට්ටම් ඉහළ යෑමේ නැඹුරුවක් පෙන්නුම් කළ ද, ආහාර නොවන කාණ්ඩයෙන් පොදු මිල මට්ටමට ඇති කළ බලපෑම ආහාර කාණ්ඩයට සාපේක්ෂව අඩු මට්ටමක පැවතුණි. තවද, ජාත්‍යන්තර වෙළඳපොළේ සිදු වූ මිල ඉහළ යෑම්, නිෂ්පාදන හිඟතාවයන් සහ සැපයුම් ජාලවල පැවති අවහිරතා, පොදු මිල මට්ටම කෙරෙහි සැලකිය යුතු බලපෑමක් ඇතිකරන ලදී.

> ***2021 වසරේ ජනවාරි සිට සැප්තැම්බර් දක්වා වූ කාලපරිච්ඡේදය තුළ පොදු මිල මට්ටම සමස්තයක් ලෙස ඉහළ යෑමේ ප්‍රවණතාවක් පෙන්නුම් කළ අතර, ආහාර මිල ගණන් ඉහළ යෑම මේ සඳහා ප්‍රධාන වශයෙන් දායක විය...***

2021 වසරේ මේ දක්වා නිතර මිල උච්චාවචන[2] සහිත ආහාර කාණ්ඩයේ අයිතමවල මිල ගණන් ඉහළ ගිය අතර, ජනවාරි සහ පෙබරවාරි මාසවල දී ප්‍රධාන වශයෙන් සහල්, පොල්, සහ එළවළු මිලෙහි සිදු වූ ඉහළ යෑම් හේතුවෙන් නිතර මිල උච්චාවචන සහිත ආහාර කාණ්ඩයේ මිල ගණන් ඉහළ ගියේය. එසේ වුවද, පොල්, එළවළු, සහ අර්තාපල් මිල ගණන් අඩුවීම හේතුවෙන් නිතර මිල උච්චාවචන සහිත ආහාර කාණ්ඩයේ අයිතමවල මිල ගණන් මාර්තු සහ අප්‍රේල් මාසවල දී පහළ ගියේය. මෙම පහළ යෑමේ නැඹුරුව ඉන් අනතුරුව වෙනස් වූ අතර, ජූනි මාසයේ දී මෙම කාණ්ඩයේ මිල ගණන්හි පෙන්නුම් කළ කැපී පෙනෙන ඉහළ යෑම සඳහා සහල්, එළවළු සහ නැවුම් මත්ස්‍ය මිල ගණන්හි ඉහළ යෑම් හේතු විය. මේ අතර, ප්‍රධාන වශයෙන් සහල්, එළවළු, සහ අර්තාපල් මිල පහළ යෑම සැප්තැම්බර් මාසයේ දී මෙම කාණ්ඩයේ මිල ගණන්වල වාර්තා වූ පහළ යෑමට ප්‍රධාන වශයෙන් දායක විය. 2021 වසරේ ජූලි මාසය දක්වා සහල් මිල ගණන් අඛණ්ඩව ඉහළ ගිය අතර, 2020/2021 මහ අස්වැන්න වෙළඳපොළට ලැබෙමින් පැවති මාසවල දී ද සහල් මිල පහළ යෑමක් දක්නට නොලැබුණි. කෙසේ වුවද, රජය මගින් ගනු ලැබූ පියවර කිහිපයක් හේතුවෙන් 2021 වසරේ අගෝස්තු සහ සැප්තැම්බර් මාසවල දී සහල් මිල පහළ යන ලදී. තවද, සම්බා, නාඩු, සුදු කැකුළු, සහ රතු කැකුළු සහල් සඳහා පනවා තිබූ උපරිම සිල්ලර මිල ගණන් 2021 සැප්තැම්බර් 02 වන දින සිට කිලෝග්‍රෑමයක් මත පිළිවෙළින් රුපියල් 103, රුපියල් 98, රුපියල් 95, සහ රුපියල් 95ක් ලෙස සංශෝධනය කළ අතර, එම මිල ගණන් 2021 සැප්තැම්බර් 29 දක්වා බලපැවැත්වුණි. ඉන් අනතුරුව, දේශීය වෙළඳපොළෙහි සහල් හිඟයක් ඇති වීම වැළැක්වීම අරමුණු කරමින් රජය විසින් මෙම උපරිම සිල්ලර මිල ගණන් පනවමින් නිකුත් කළ ගැසට් නිවේදන අවලංගු කරන ලදී. කොවිඩ්-19 වසංගතයේ ව්‍යාප්තියත් සමඟ පනවන ලද සංචරණ සීමා, ප්‍රධාන ආර්ථික මධ්‍යස්ථානවල වෙළඳාම් කටයුතු සීමා සහිත වීම, සහ අහිතකර කාලගුණ තත්ත්වයන් මූලික කොටගෙන, 2021 වසරේ මේ දක්වා එළවළු මිල ගණන් මිශ්‍ර විචලන පෙන්නුම් කළේය. 2021 වසරේ මේ දක්වා සමස්තයක් ලෙස පොල් මිල ගණන් පහළ යෑමේ නැඹුරුවක් පෙන්නුම් කළ අතර, මේ හේතුවෙන් පොල් සඳහා උපරිම සිල්ලර මිල ගණන් පනවමින් නිකුත් කළ ගැසට් නිවේදනය 2021 ජූනි 18 වන දින සිට බලපැවැත්වෙන පරිදි අවලංගු කරන ලදී. කුකුළු ආහාර සඳහා යොදා ගනු ලබන බඩඉරිඟු සහ ප්‍රතිජීවක ඖෂධ ආදියෙහි මිල ගණන් ඉහළ යෑම හේතුවෙන් කුකුළු මස් නිෂ්පාදන පිරිවැය ඉහළ ගිය අතර, මේ හේතුවෙන් 2021 වසරේ මේ දක්වා කුකුළු මස් මිල සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. ශ්‍රී ලංකා මුහුදු කලාපය තුළ දී අනතුරට පත් වූ එක්ස්ප්‍රස් පර්ල් භාණ්ඩ නෞකාව (MV X-Press Pearl) මගින් සිදු වූ සමුද්‍ර හානිය මධ්‍යයේ වුවද නැවුම් මත්ස්‍ය මිල ගණන් 2021 වසරේ මේ දක්වා ඉහළ යෑමක් පෙන්නුම් කරන ලදී. තවද, සලකා බලනු ලබන කාලපරිච්ඡේදය තුළ දී අර්තාපල් මිල ස්ථාවර මට්ටමක පැවතුණි. මේ සඳහා, 2021 පෙබරවාරි 12 වන දින සිට බලපැවැත්වෙන පරිදි ආනයනික අර්තාපල් කිලෝග්‍රෑමයක් මත වූ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද රුපියල් 55 සිට රුපියල් 15 දක්වා පහත දැමීම හේතු විය. එසේ වුවද, අපේක්ෂිත ඉහළ දේශීය අර්තාපල් අස්වැන්න තුළින් දේශීය ගොවීන්ට වැඩි ප්‍රතිලාභ ලබාදීමේ අරමුණින් අස්වනු නෙළන සමයේ දී ආනයන අධෛර්යමත් කිරීම සඳහා රජය විසින් නැවතත් ආනයනික අර්තාපල් කිලෝග්‍රෑමයක් මත විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද 2021 අප්‍රේල් 27 දින සිට බලපැවැත්වෙන පරිදි රුපියල් 50 දක්වා ඉහළ දමන ලදී. මේ අතර, සලකා බලනු ලබන කාලපරිච්ඡේදය තුළ දී රතු ළූණු සහ ලොකු ළූණු මිලෙහි සමස්ත වශයෙන් පහළ යෑමක් දක්නට ලැබුණි.

---

1 ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් කොළඹ පාරිභෝගික මිල දර්ශකය (කො.පා.මි.ද., 2013=100) සහ ජාතික පාරිභෝගික මිල දර්ශකය (ජා.පා.මි.ද., 2013=100) මාසිකව සම්පාදනය කරනු ලබයි.

2 සහල්, මස් වර්ග, නැවුම් මත්ස්‍ය සහ මුහුදු ආහාර, පොල්, පලතුරු, එළවළු, අර්තාපල්, ළූණු, සහ තෝරාගත් කුළුබඩු වර්ග නිතර මිල උච්චාවචන සහිත ආහාර කාණ්ඩයට ඇතුළත් වේ.

***2021 වසරේ මේ දක්වා සහල්, එළවළු, නැවුම් මත්ස්‍ය සහ පොල් මිල ගණන් නිතර මිල උච්චාවචන සහිත ආහාර කාණ්ඩයේ මිල ගණන්හි හැසිරීමට සැලකිය යුතු බලපෑමක් ඇති කළේය...***

2021 වසරේ මුල් මාස නවය තුළ දී නිතර මිල උච්චාවචන සහිත ආහාර අයිතම හැර අනෙකුත් ආහාර අයිතමයන්ගේ මිල ගණන් අඛණ්ඩව ඉහළ ගියේය. ඒ අනුව, වසරේ මේ දක්වා නොකඩවා ඉහළ ගිය පරිප්පු මිල, 2020 වසරේ අනුරූප කාලපරිච්ඡේදය තුළ නිරීක්ෂණය වූ මිල මට්ටම්වලට වඩා ඉහළ අගයක පැවති අතර, මේ සඳහා ලෝක වෙළඳපොළෙහි සිදු වූ මිල ඉහළ යෑම් හේතු විය. මීට අමතරව, දේශීය කරවල නිෂ්පාදකයන් දිරිමත් කිරීමේ අරමුණින්, 2021 අගෝස්තු 12 වන දින සිට බලපැවැත්වෙන පරිදි කරවල කිලෝග්‍රෑමයක් මත වූ රුපියල් 100ක විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද එලෙසම පවත්වාගෙන යායුතු බවට ගැසට් නිවේදනයක් නිකුත් කරන ලදී. 2021 අප්‍රේල් සිට අගෝස්තු දක්වා කාලය තුළ දී ඉහළ ගිය සීනි මිල, සැප්තැම්බර් මාසයේ දී පහළ ගිය අතර, මේ සඳහා 2021 සැප්තැම්බර් 02 වන දින සිට බලපැවැත්වෙන පරිදි පැකට් නොකළ සුදු සීනි කිලෝග්‍රෑමයක් මත රුපියල් 122ක් සහ පැකට් කළ සුදු සීනි කිලෝග්‍රෑමයක් මත රුපියල් 125ක් වශයෙන් උපරිම සිල්ලර මිල ගණන් පැනවීම හේතු විය. මේ අතර, 2020 වසර පුරා නොවෙනස්ව පැවති ආනයනික කිරිපිටි මිල, 2021 ඔක්තෝබර් 09 වන දින සිට බලපැවැත්වෙන පරිදි සංශෝධනය කෙරුණු අතර ඒ අනුව, ආනයනික කිරි පිටි ග්‍රෑම් 400 පැකට්ටුවක මිල රුපියල් 100කින් ඉහළ නංවන ලදී. මෙම මිල සංශෝධනය සඳහා ලෝක

**4.1 සටහන**

**2021 වසරේ එල්.පී. ගෑස් සහ ඉන්ධන මිල සංශෝධන**

| අයිතමය | ඒකකය | සංශෝධිත මිල (රුපියල්) | බලපැවැත්වෙන දිනය |
|---|---|---|---|
| එල්.පී. ගෑස් | | | |
| ලිට්‍රෝ ගෑස් ලංකා සමාගම | කි.ග්‍රෑ. 9.6 | 1,150.00 | 25.07.2021 |
| | කි.ග්‍රෑ. 12.5 | 2,675.00 | 10.10.2021 |
| ලාෆ්ස් ගෑස් සමාගම | කි.ග්‍රෑ. 12.5 | 1,856.00 | 12.08.2021 |
| | කි.ග්‍රෑ. 12.5 | 2,840.00 | 10.10.2021 |
| ඉන්ධන | | | |
| පෙට්‍රල් (92 ඔක්ටේන්) | | | |
| සිපෙට්කෝ සහ ලංකා IOC | ලීටර් 1 | 157.00 | 12.06.2021 |
| ලංකා IOC | ලීටර් 1 | 162.00 | 22.10.2021 |
| සුදු ඩීසල් | | | |
| සිපෙට්කෝ සහ ලංකා IOC | ලීටර් 1 | 111.00 | 12.06.2021 |
| ලංකා IOC | ලීටර් 1 | 116.00 | 22.10.2021 |
| භූමිතෙල් | | | |
| සිපෙට්කෝ සහ ලංකා IOC | ලීටර් 1 | 77.00 | 12.06.2021 |


*මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව*

වෙළඳපොළ මිල ගණන් සහ නැව් ගාස්තු ඉහළ යෑම මෙන්ම දේශීය වෙළඳපොළෙහි පැවති මිල පාලනයන් ලිහිල් කිරීම ද හේතු විය. ඊට අනුකූලව, 2021 ඔක්තෝබර් 15 වන දින සිට, දේශීය කිරිපිටි ග්‍රෑම් 400 පැකට්ටුවක මිල ද රුපියල් 90කින් ඉහළ නංවන ලදී. තවද, 2021 ඔක්තෝබර් 10 වන දින සිට බලපැවැත්වෙන පරිදි තිරිඟු පිටි කිලෝග්‍රෑමයක් රුපියල් 10කින් ඉහළ යෑම හේතුවෙන්, 2021 ඔක්තෝබර් 11 වන දින සිට ග්‍රෑම් 450ක් බරැති පාන් ගෙඩියක මිල රුපියල් 5කින් ඉහළ දැමූ අතර ඊට සමගාමීව අනෙකුත් බේකරි නිෂ්පාදනවල මිල ගණන් ද ඉහළ දමන ලදී.

ආහාර කාණ්ඩයට සාපේක්ෂව පොදු මිල මට්ටම මත ඇති කරන ලද බලපෑම අවම වුවද, 2021 ජනවාරි සිට සැප්තැම්බර් අවසානය දක්වා වූ කාලපරිච්ඡේදය තුළ දී ආහාර නොවන කාණ්ඩයේ අයිතමවල මිල ගණන් ඉහළ යෑමක් පෙන්නුම් කළේය. ඒ අනුව සලකා බලන කාලපරිච්ඡේදය තුළ දී ජාත්‍යන්තර පාසල් ගාස්තු, පෞද්ගලික වෛද්‍ය සේවා ගාස්තු හා පෞද්ගලික රෝහල් ගාස්තු ඉහළ යන ලදී. තවද, 2021 මාර්තු සහ ජූලි මාසවල දී ආපනශාලා සහ හෝටල් උප කාණ්ඩයට අයත් පිළියෙල කරන ලද ආහාර අයිතම කිහිපයක මිල ගණන්වල ඉහළ යෑම් වාර්තා විය. තවද, ලෝක වෙළඳපොළෙහි ගෑස් මිල ගණන් ඉහළ යෑමට අනුව යමින් ලිට්‍රෝ ගෑස් ලංකා සමාගම සහ ලාෆ්ස් ගෑස් සමාගම 2021 ඔක්තෝබර් 10 වන දින සිට බලපැවැත්වෙන පරිදි කිලෝග්‍රෑම් 12.5ක් බරැති එල්.පී. ගෑස් සිලින්ඩරයක මිල සැලකිය යුතු ලෙස ඉහළ දමන ලදී. මෙම සංශෝධන හේතුවෙන්, දේශීය වෙළඳපොළෙහි පිළියෙල කරන ලද ආහාර මිල ගණන් ඉහළ ගියේය. මීට අමතරව, වසරකට අධික කාලයක් එකම මට්ටමේ පැවති දේශීය ඉන්ධන මිල ඉහළ දමන ලද අතර, ඒ අනුව, පෙට්‍රල් (92 ඔක්ටේන්), සුදු ඩීසල් සහ භූමිතෙල් මිල ගණන් 2021 ජූනි 12 වන දින සිට බලපැවැත්වෙන පරිදි සංශෝධනය විය. කෙසේ වුවද, කොවිඩ්-19 ව්‍යාප්තියට පෙර පැවති ප්‍රවණතාවන්ට වෙනස්ව යමින්, නිවාස කුලිය 2021 වසරේ මේ දක්වා ස්ථාවර මට්ටම්හි පැවතුණි.


***ආහාර නොවන කාණ්ඩයේ අයිතමවල මිල ගණන් ඉහළ යෑම කෙරෙහි සැලකිය යුතු බලපෑමක් ඇති කරමින්, 2020 වසරේ සිට නොවෙනස්ව පැවති ඉන්ධන සහ එල්.පී. ගෑස් මිල ගණන් 2021 වසරේ දෙවන භාගයේ දී ඉහළ ගියේය...***

රූප සටහන 4.1
කො.පා.මි. දර්ශකයෙහි මාසික ප්‍රතිශත වෙනස සඳහා දායකත්වය




මූලයන්: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

රූප සටහන 4.2
ජා.පා.මි. දර්ශකයෙහි මාසික ප්‍රතිශත වෙනස සඳහා දායකත්වය




මූලයන්: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

## පාරිභෝගික මිල දර්ශක

### කොළඹ පාරිභෝගික මිල දර්ශකය

2021 වසරේ ජනවාරි සිට සැප්තැම්බර් දක්වා කාලපරිච්ඡේදය තුළ දී කො.පා.මි.ද. සමස්ත වශයෙන් ඉහළ යෑමේ ප්‍රවණතාවක් පෙන්නුම් කළ අතර, 2021 ජනවාරි මාසයේ දී දර්ශකාංක 138.7හි සිට 2021 සැප්තැම්බර් මාසයේ දී දර්ශකාංක 144.1ක් ලෙස වාර්තා විය. ආහාර සහ ආහාර නොවන කාණ්ඩ දෙකෙහිම අයිතමවල මිල ගණන්හි සිදු වූ විචලන හේතුවෙන් කො.පා.මි.ද. 2021 ජනවාරි සහ පෙබරවාරි මාසවල දී ඉහළ ගියේය. එසේ වුවද, මාර්තු සහ අප්‍රේල් මාස දෙක තුළ දී කො.පා.මි.ද. පහළ ගිය අතර, එයට මුළුමනින්ම දායක වූයේ ආහාර කාණ්ඩයේ අයිතමවල මිල ගණන්හි සිදු වූ විචලනයන්ය. ඉන් පසුව, මැයි සහ ජූනි මාසවල දී කො.පා.මි.ද. ඉහළ යෑම සඳහා ආහාර සහ ආහාර නොවන කාණ්ඩ දෙකෙහිම අයිතමවල මිල ගණන්හි ඉහළ යෑම් දායක වූ අතර, ආහාර කාණ්ඩය සාපේක්ෂ වශයෙන් වැඩි දායකත්වයක් දක්වන ලදී. ජූලි මාසයේ දී කො.පා.මි.ද. ඉහළ යෑමට මුළුමනින්ම දායක වූයේ ආහාර නොවන කාණ්ඩයේ අයිතමවල මිල ගණන්හි සිදු වූ විචලන වුවද, අගෝස්තු සහ සැප්තැම්බර් මාසවල කො.පා.මි.ද. ඉහළ යෑම සඳහා ආහාර සහ ආහාර නොවන කාණ්ඩ දෙකෙහිම අයිතමවල මිල ඉහළ යෑම් දායක විය.

> ***කො.පා.මි.ද. සහ ජා.පා.මි.ද., 2021 වසරේ ජනවාරි සිට සැප්තැම්බර් දක්වා වූ මාස නවය තුළ දී සමස්ත වශයෙන් ඉහළ යෑමේ නැඹුරුවක් පෙන්නුම් කළේය...***


### ජාතික පාරිභෝගික මිල දර්ශකය

2021 මාර්තු මාසයේ වාර්තා වූ මාසික පහළ යෑම හැරුණු විට, ජා.පා.මි.ද. ජනවාරි මාසයේ දී වාර්තා කළ දර්ශකාංක 142.1හි සිට සැප්තැම්බර් මාසයේ දී වාර්තා කළ දර්ශකාංක 147.5 දක්වා, අඛණ්ඩව ඉහළ ගියේය. 2021 ජනවාරි සහ පෙබරවාරි මාසවල දක්නට ලැබුණු මාසික ඉහළ යෑම් සඳහා ආහාර සහ ආහාර නොවන කාණ්ඩ දෙකෙහිම අයිතමවල මිල ගණන්හි ඉහළ යෑම් හේතු විය. මෙම ඉහළ යෑමේ ප්‍රවණතාව, 2021 මාර්තු මාසයේ දී ආපසු හැරවීමට මුළුමනින්ම හේතු වූයේ ආහාර කාණ්ඩයේ අයිතමවල මිල ගණන් පහළ යෑමයි. කෙසේ වුවද, ඉන් අනතුරුව 2021 අප්‍රේල් මාසයේ දී කොවිඩ්-19 වසංගතයේ තුන්වන රැල්ල ආරම්භ වීමත් සමගම ආහාර සහ ආහාර නොවන කාණ්ඩ දෙකෙහිම අයිතමවල මිල ගණන් ඉහළ යෑම හේතුවෙන්, 2021 සැප්තැම්බර් මාසය දක්වා ජා.පා.මි.ද. ඉහළ ගියේය.

### මතුපිට උද්ධමනය


2021 සැප්තැම්බර් මාසයෙන් අවසන් වූ මාස නවය තුළ දී, කො.පා.මි. දර්ශකයෙහි වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස මගින් මනිනු ලබන මතුපිට උද්ධමනය සමස්තයක් වශයෙන් ඉහළ යෑමේ ප්‍රවණතාවක් පෙන්නුම් කළ අතර, මෙම කාලපරිච්ඡේදයේ අවසන් මාසවල දී එම අගය 4.0%ත් 6.0%ත් අතර ඉලක්කගත පරාසයේ ඉහළ සීමාවේ පැවතුණි. ඒ අනුව, කො.පා.මි.ද. මත පදනම් වූ වාර්ෂික ලක්ෂ්‍යමය මතු උද්ධමනය, ජනවාරි මාසයේ වාර්තා වූ 3.0%හි සිට මාර්තු මාසයේ දී 4.1% දක්වා ඉහළ ගොස් අප්‍රේල් මාසයේ දී 3.9% දක්වා පහළ ගියේය. ඉන් අනතුරුව, කොවිඩ්-19 තුන්වන රැල්ලේ වර්ධනයත් සමග මැයි මාසයේ දී වාර්තා වූ 4.5%හි සිට අගෝස්තු

**රූප සටහන 4.3**
**කො.පා.මි.ද. මත පදනම් වූ මතුපිට උද්ධමනය**
**(වාර්ෂික ලක්ෂ්‍යමය ප්‍රතිශත වෙනස)**




මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

**රූප සටහන 4.4**
**ජා.පා.මි.ද. මත පදනම් වූ මතුපිට උද්ධමනය**
**(වාර්ෂික ලක්ෂ්‍යමය ප්‍රතිශත වෙනස)**




මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

මාසයේ දී වාර්තා වූ 6.0% දක්වා මතුපිට උද්ධමනය අඛණ්ඩ ඉහළ යෑමක් පෙන්නුම් කරන ලදී. ඉන් පසුව, ඉහළ යෑමේ ප්‍රවණතාව වෙනස් කරමින් කො.පා.මි. දර්ශකයෙහි වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස, 2021 සැප්තැම්බර් මාසයේ දී 5.7% දක්වා නැවත පහළ ගියේය. මෙම කාලපරිච්ඡේදය පුරා කො.පා.මි.ද. මත පදනම් වූ ආහාර සහ ආහාර නොවන උද්ධමනය සමස්ත වශයෙන් ඉහළ යෑමේ ප්‍රවණතාවක් පෙන්නුම් කළ අතර, ආහාර උද්ධමනය බොහෝ දුරට 10%ට වඩා ඉහළ අගයක පැවතුණි. ජා.පා.මි.ද. මත පදනම් වූ මතුපිට උද්ධමනය, 2021 සැප්තැම්බර් මාසයෙන් අවසන් වූ මාස නවය තුළ දී කො.පා.මි.ද. මත පදනම් වූ මතුපිට උද්ධමනයට වඩා ඉහළින් පැවතුණි. ජා.පා.මි.ද. මත පදනම් වූ මතුපිට උද්ධමනය ජනවාරි මස පැවති 3.7%හි සිට ජූලි මාසයේ දී 6.8% දක්වා ඉහළ ගිය අතර, ඉන් අනතුරුව එම ප්‍රවණතාව ආපසු හරවමින් 2021 සැප්තැම්බර් මාසය වන විට එය 6.2% දක්වා පහළ යන ලදී. 2021 වසරේ මේ දක්වා ජා.පා.මි.ද. මත පදනම් වූ ආහාර සහ ආහාර නොවන උද්ධමනය ඉහළ ගිය අතර, ආහාර උද්ධමනය ජනවාරි මාසයේ වාර්තා වූ 5.9%හි සිට සැප්තැම්බර් මාසයේ දී 10.0% දක්වා ඉහළ ගියේය.

> ***මතුපිට උද්ධමනය ඉහළ අගයන්හි පැවති අතර, ආහාර උද්ධමනය බොහෝදුරට 10%ට වඩා ඉහළ අගයක පැවතුණි...***

## 4.2 වැටුප්

කුඩා කර්මාන්තවල සේවක වැටුප් පහත වැටීම හේතුවෙන් 2021 අප්‍රේල් මාසයේ දී වාර්තා වූ පහළ යෑම හැරුණු විට අවිධිමත් පෞද්ගලික අංශයේ වැටුප් ප්‍රමාණ දර්ශකය (2012=100) මගින් මනිනු ලබන අවිධිමත් පෞද්ගලික අංශයේ සේවකයන්ගේ නාමික වැටුප්, 2021 අගෝස්තු මාසයෙන් අවසන් වූ මාස අටක කාලපරිච්ඡේදය තුළ දී ඉහළ යෑමේ ප්‍රවණතාවක් පෙන්නුම් කළේය. 2020 ජනවාරි සිට අගෝස්තු දක්වා වූ කාලපරිච්ඡේදය සමඟ සැසඳීමේ දී අවිධිමත් පෞද්ගලික අංශයේ නාමික වැටුප්, 2021 වසරේ එම කාලපරිච්ඡේදය තුළ දී, 5.9%කින් ඉහළ ගියේය. ඒ අනුව 2020 ජනවාරි සිට අගෝස්තු දක්වා වූ කාලපරිච්ඡේදය හා සැසඳීමේ දී, 2021 වසරේ අනුරූප කාලපරිච්ඡේදය තුළ දී කෘෂිකර්මාන්ත, කර්මාන්ත, සහ සේවා යන සියලුම උප අංශවල සේවකයන්ගේ නාමික වැටුප් ප්‍රමාණ දර්ශක පිළිවෙළින් 3.4%කින්, 6.6%කින් සහ 6.5%කින් ඉහළ ගියේය. මේ අතර, අවිධිමත් පෞද්ගලික අංශයේ මූර්ත වැටුප් ප්‍රමාණ දර්ශකය 2020 ජනවාරි සිට අගෝස්තු දක්වා වූ කාලපරිච්ඡේදය සමඟ සැසඳීමේ දී, 2021 වසරේ අනුරූප කාලපරිච්ඡේදය තුළ දී 0.4%කින් සුළු වශයෙන් ඉහළ ගියේය.

> ***2021 වසරේ ජනවාරි සිට අගෝස්තු දක්වා මාස අටක කාලපරිච්ඡේදය තුළ දී අවිධිමත් පෞද්ගලික අංශයේ නාමික වැටුප් ප්‍රමාණ දර්ශකය සමස්තයක් ලෙස ඉහළ යෑමේ ප්‍රවණතාවක් පෙන්නුම් කළේය...***

පඩිපාලක සභා මගින් වැටුප් පාලනය වන සේවකයන්ගේ අවම වැටුප් ප්‍රමාණ දර්ශකය[3] (1978 දෙසැම්බර්=100) මගින් මනිනු ලබන විධිමත්

3 පඩිපාලක සභා මගින් වැටුප් පාලනය වන විධිමත් පෞද්ගලික අංශයේ සේවකයන්ගේ නාමික වැටුප්, කම්කරු දෙපාර්තමේන්තුව විසින් සම්පාදනය කරන අවම වැටුප් ප්‍රමාණ දර්ශකය (1978 දෙසැම්බර්=100) මගින් ගණනය කරනු ලබයි.

පෞද්ගලික අංශයේ එම කාණ්ඩයට අයත් සේවකයන්ගේ නාමික වැටුප්, 2020 අගෝස්තු මාසයෙන් අවසන් වූ මාස අටක කාලපරිච්ඡේදය සමඟ සැසඳීමේ දී, 2021 අනුරූප කාලපරිච්ඡේදය තුළ දී 66.0%කින් සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. මෙම සැලකිය යුතු ඉහළ යෑමට, 2021 මාර්තු 05 වන දින සිට බලපැවැත්වෙන පරිදි, තේ සහ රබර් වගා කිරීම හා නිෂ්පාදනයට අදාළ පඩිපාලක සභා හරහා තේ සහ රබර් වතු කම්කරුවන්ගේ දෛනික වැටුප රුපියල් 1,000ක් දක්වා ඉහළ නැංවීම හේතු විය. තවද, 2016 අංක 3 දරන ජාතික අවම සේවක වැටුප් පනතට ගෙන එන ලද සංශෝධනය අනුව 2021 අගෝස්තු 16 වන දින සිට පෞද්ගලික අංශයේ අවම මාසික වැටුප රුපියල් 10,000 සිට රුපියල් 12,500 දක්වා සහ අවම දෛනික වැටුප රුපියල් 400 සිට රුපියල් 500 දක්වා ඉහළ නැංවීම ද, මෙම නාමික වැටුප් ඉහළ යෑමට දායක විය. ඒ අනුව, 2021 වසරේ අගෝස්තු මාසයෙන් අවසන් වූ මාස අටක කාලපරිච්ඡේදය තුළ දී විධිමත් පෞද්ගලික අංශයේ සේවකයන්ගේ මූර්ත වැටුප් ප්‍රමාණ දර්ශකය ද 58.6%කින් සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. මේ අතර, කොවිඩ්-19 වසංගතය හේතුවෙන් සේවකයන්ට නිවසෙහි රැඳී සිටීමට සිදුවන අවස්ථාවල දී සේවකයාට අවසන් වරට ගෙවූ මූලික වැටුපෙන් 50%ක් හෝ මසකට රුපියල් 14,500ක් යන විකල්ප දෙකින් සේවකයාට වඩාත් වාසිදායක වන පරිදි වැටුප් ගෙවීමේ එකඟතාවක් සහිත වූ ත්‍රෛපාර්ශවික ගිවිසුම, සංචාරක අංශය සඳහා 2021 දෙසැම්බර් දක්වා දීර්ඝ කරන ලදී.

> **වතු කම්කරුවන්ගේ දෛනික වැටුප ඉහළ යෑම සහ අවම වැටුප් ඉහළ යෑමත් සමඟ විධිමත් පෞද්ගලික අංශයේ නාමික වැටුප් ප්‍රමාණ දර්ශක, 2021 වසරේ ජනවාරි සිට අගෝස්තු දක්වා වූ මාස අටක කාලපරිච්ඡේදය තුළ දී සමස්තයක් ලෙස ඉහළ ගියේය...**

රාජ්‍ය අංශයේ වැටුප් ප්‍රමාණ දර්ශකය (2016=100) මගින් මනිනු ලබන රාජ්‍ය අංශයේ සේවකයන්ගේ නාමික වැටුප් 2020 වසරේ අගෝස්තු මාසයෙන් අවසන් වූ මාස අටක කාලපරිච්ඡේදය සමඟ සැසඳීමේ දී, 2021 වසරේ එම කාලපරිච්ඡේදය තුළ දී නොවෙනස්ව පැවතුණි. එසේ වුවද, 2020 වසරේ අගෝස්තු දක්වා වූ මාස අටක කාලපරිච්ඡේදය සමඟ සැසඳීමේ දී 2021 වසරේ අනුරූප කාලපරිච්ඡේදය තුළ දී රාජ්‍ය අංශයේ සේවකයන්ගේ මූර්ත වැටුප් 5.2%කින් පහළ ගියේය.